The Journal of Archaeology and Heritage Studies (JAHS) 10 (II) 2023: 109-121 pp

The Journal of ARCHAEOLOGY & HERITAGE STUDIES

Journal Home page http://ssh.rjt.ac.lk/index.php/jahs/

Research Paper

# ත්‍රිකුණාමලය ෆෙඩ්‍රික් බලකොටුව පරිශ්‍රයෙහි ඇති යටත් විජිත අවධියට අයත් සොහොන් ස්මාරක

**මන්දාරම්නුවර චන්දානන්ද හිමි**

ත්‍රිකුණාමලය ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල. mandaramnuwara@gmail.com

**ABSTRACT**

භූ විෂමතාවයෙහි සුවිශේෂිත්වය සැළකිල්ලට ගෙන වසර දහස් ගණනක් තිස්සේ ගෝකණ්ණ වරාය හෙවත් වර්තමාන ත්‍රිකුණාමලය වාණිජමය වශයෙන් පාලකයින්ගේ විශේෂ අවධානයට ලක්ව පැවති බිම් කොටසකි. ලෝකයේ ස්වාභාවික ව ආරක්ෂාව සැපයෙන වරායන් අතරින් ත්‍රිකුණාමලය වරාය ප්‍රමුඛ ය. එබැවින් ම ත්‍රිකුණාමලය විදේශීය රාජ්‍යයන්ගේ විශේෂ අවධානයට පත් ව පැවතියා සේ ම ක්‍රි.ව. 1505 න් පසු විදේශීය ආක්‍රමණිකයින් හතරක් යටතේ ද මෙම බිම්කඩ පැවතිණ. එකිනෙකා පරයා යමින් මෙම බිම් කොටස අල්ලා ගැනීමට තරඟයක් ඇතිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් විදේශීය ජන කොටස් හතරක සිහිවටන ද ප්‍රදේශයෙහි තැනින් තැන අදට ද ශේෂ වී ඇත. එසේ පැවති සොහොන් ස්මාරක ශේෂ අතරින් ෆෙඩ්‍රික් බලකොටුවේ ඇති සොහොන් ගොඩැලි 10 ක් හා ඒවායෙහි සිහිවටන ඵලකවල ඇති තොරතුරු පිළිබඳ ව මෙහි දී අවධානය යොමු කෙරේ. මේවා අදින් වසර 200-250 අතර කාලයකට අයත් පැරණි පුරාවිද්‍යා ස්මාරක වේ. ත්‍රිකුණාමලය ෆෙඩ්‍රික් කොටුවෙහි පෘතුගීසි, ලන්දේසි, ප්‍රංශ සහ ඉංග්‍රීසි යන විදේශීයයන්ගේ ඉදිකිරීම් අවශේෂ දැකගත හැකිය. එහි දී ප්‍රස්තුතයට අදාළ සොහොන් ස්මාරක විවිධ යුධ අවස්ථාවන්හි මියගියවුන්ගේ ශරීර හෝ අලු තැන්පත් කොට ඉදිකරන ලද ඒවාය. මේවා ප්‍රභූ පැළැන්තියේ සොල්දාදුවන්ගේ හෝ නිලධාරීන්ගේ බවට නිශ්චය කරනුයේ යුද්ධ පවතින කාලසීමාවක වාස්තුවිද්‍යාත්මක ව හා අලංකාරවත් ව මේවා ඉදිකර තිබීම, ඔවුන්ගේ තොරතුරු ඇතුළත් විස්තර ඵලක ප්‍රදර්ශනය කර තිබීම, හා ඉහළ ගෞරවයක් හිමිකර දියයුතු ආකාරයට වේදිකා සකස් කොට ස්මාරක ඉදිකර තිබීම යන සාධක හේතුවෙනි. මේවා පුරාවිද්‍යා ස්මාරක බැවින් මෙම සමරු ඵලකවල ඇති විස්තර අභිලේඛනමය වශයෙන් ද වැදගත් ය. මේවා නෙදර්ලන්ත හා ඉංග්‍රීසි භාෂාවෙන් ලියැවී තිබේ. මේවායේ ඇති ලාංඡන ද වෙන ම අධ්‍යයනය කළ යුතු කොටසකි.

**මුඛ්‍ය පද: ශවෝපචාර පුරාවිද්‍යාව, ෆෙඩ්‍රික් බලකොටුව, යටත්විජිත ස්මාරක, නැගෙනහිර පළාතේ අභිලේඛන**

ARTICLE INFO

*Article history:*
Received 15 October 2023
Accepted 06 June 2024
Available online 08 August 2024

## 1. හැඳින්වීම

ක්‍රි.ව. 16 වැනි සියවසින් පසු හා 20 වැනි සියවසට පෙර යටත්විජිතවාදීන්ට අයත් සුසාන ඊට නතුවූ රටවල සුලභව හමුවේ. ශ්‍රී ලංකාවෙන් ද එවැනි සුසාන පොකුරු කිහිපයක් හඳුනාගෙන තිබේ. ත්‍රිකුණාමලය ෆෙඩ්‍රික් කොටුවේ සුසාන බිම ඒ අතරින් එකකි.

### 1.1 පර්යේෂණ ප්‍රදේශය හා ඉතිහාසය

පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි හා ප්‍රංශ යන විජාතීන්ගේ දීර්ඝ කාලීන හා කෙටි කාලීන බල ආධිපත්‍යයන්ට නතු වූ ත්‍රිකුණාමලය නැගෙනහිර වෙරළ තීරය වාණිජමය වශයෙන් අතීතයේ සිට ම වැදගත් භූමිභාගයක් විය. මහසෙන් රජු (ක්‍රි.ව. 277-304) මෙහි ගොඩනැංවූ



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ගෝකණ්ණ විහාරය (ඌන පූරණ සහිතො මහාවංසො 1959: 37 පරි 41) එයින් පසුව V වැනි අග්ගබෝධි රජු (ක්‍රි. ව. 718-724) ගෝකණ්ණ විහාරයට පධානඝරයක් සකස් කොට පූජා කිරීම (ඌන පූරණ සහිතො මහාවංසො 1959: 46 පරි 05), මහා විජයබාහු රජු (ක්‍රි.ව. 1055-1110) සොලීන් පළවා හැර ගෝකණ්ණ විහාරයට හා කෝණිෂ්වරම් කෝවිලට එකසේ පුදපූජා පැවැත්වීම, දෙවැනි ගජබා රජ දවස (ක්‍රි. ව. 1133-1155) කෝවිල පවිත්‍ර කරලීමේ මහා පූජාවක් පවත්වා සෙල්ලිපියක් පිහිටුවීම හා චෝඩගංග නම් පාණ්ඩ්‍ය කුමාරයෙකු ගෝකණ්ණ පර්වතයට පැමිණ, තම ගෝත්‍ර සංකේතය වූ මත්ස්‍ය යුගල සහිත දෙමළ අක්ෂර යෙදූ සංස්කෘත ටැම් ලිපියක් පිහිටුවීම ඓතිහාසික ව විශේෂිත කරුණු වේ. ක්‍රි.ව. 1624 දී පෘතුගීසීහු නැගෙනහිර සමුද්‍රයෙහි නාවික මුර සේවයක් පිහිටුවා කිසිඳු නාවික යාත්‍රාවකට උඩරට රාජ්‍ය සමග සම්බන්ධ විය නොහැකි සේ බාධක පණවා ගෝණගල් කන්දෙහි ගෝකර්ණ විහාර හා ශිව කෝවිල බිඳුවා එහි කොටුවක් තනවා ඔවුන්ගේ හමුදාව රැඳවීම, ලන්දේසි ආණ්ඩුකාර රයික්ලොප් වැන් ගෝන්ස් (ක්‍රි.ව. 1675 - 1679) උඩරැටියන්ගේ විරෝධතාව මැද පෘතුගීසි කොටුව බිඳ ශක්තිමත් කොටුවක් ගොඩනංවා වරාය ද අත්පත් කරගෙන සිය පාලන මධ්‍යස්ථානය පිහිටුවා ගැනීම, 1672 දී ජෝන් ෆෝබස් නම් බ්‍රිතාන්‍ය තානාපතිවරයා ත්‍රිකුණාමල වරායෙන් ගොඩබැස උඩරට පාලකයින් හා සාකච්ඡා පැවැත්වීම සහ දෙවැනි රාජසිංහ රජු වරාය ද අත්පත් කරගෙන සිය පාලන මධ්‍යස්ථානය පිහිුවා ගැනීම, ලන්දේසීන් පන්නා දැමීමට ප්‍රංශ ජාතිකයින් සමග ගිවිසුමකට එළඹීමත්, එම පිරිස සමග කොට්ටියාරම් වරායට පැමිණි ප්‍රංශ ජාතික නාවික අද්මිරාල් ‘ද ලාහේයි’ ට ත්‍රිකුණාමලයේ කොටුවක් තැනීමට අවසර ලැබීමත් සමග ප්‍රංශයින්ට කොටු බැඳීමට ඉඩ නොතබා ලන්දේසි ආණ්ඩුකාර රයික්ලොප් වැන් ගෝවන්ස් (ක්‍රි.ව 1777-1775) මහත් පරිශ්‍රමයකින් ගෝණගල් කන්ද මැදිකර ශාන්ත පෙද්‍රික් නමින් කොටුවක් ගොඩනැංවීමත් විශේෂිත සන්ධිස්ථාන වේ. ක්‍රි. ව.1796 අගෝස්තු 26 වැනි දින මහ සටනකින් ලන්දේසීන් පළවාහැර බ්‍රිතාන්‍ය වෙළෙඳ සමාගම ත්‍රිකුණාමලය අල්ලාගත් අතර හඟුරන්කෙත ගිවිසුමේ සියලු වරප්‍රසාද ද ඔවුන්ට හිමිවිය. මෙකී ඉතිහාසය අතරින් 16 වැනි සියවසින් පසුව විජාතිකයින් වශයෙන් මෙරට දී මරණයට පත් වූ නිලධාරීන්ගේ හා සොල්දාදුවන්ගේ මෘත දේහ ගෞරවාන්විත ව තැන්පත් කිරීම සිදුව ඇති අතර අප අධ්‍යයනයට පාත්‍ර වන්නේ එකී සුසානයන් අතරින් කොටු පරිශ්‍රයේ පිහිටා ඇති සොහොන්වල තොරතුරු ය (සිතියම 1). මෙම සුසාන මේ වන විටත් විදේශීය ඥාතීන්ගේ ගෞරවයට ලක්වීම සිදුවේ. මෙහි ගෝලීය ස්ථානගතවීම N 8.57873 E 81.24384 Elevation -85.4 යන බණ්ඩාංක යටතේ වාර්තා




**සිතියම 1: ත්‍රිකුණාමලය කොටුව හා තදාශ්‍රිත පරිසරය චන්ද්‍රිකා ඡායාරූපයකින්**

වේ.

මෙවැනි පර්යේෂණයක් සිදු කිරීමෙහි අරමුණ වූයේ මීට වසර තුන්සීයකට ආසන්න කාලයකට අයත් සුසාන ආශ්‍රයෙන් පෙරදිග රටවලින් පැමිණි විවිධ තනතුරු දැරූ විජාතිකයින්ගේ තොරතුරු සමකාලීන මූලාශ්‍රයයන් මගින් අධ්‍යයනය කිරීම හා මේවායෙහි තැන්පත් කරන ලද පුද්ගලයින්ගේ තරාතිරම් කවරේද යනාදිය හඳුනා ගැනීමට උත්සාහ දැරීම යි. මේවා මීට පෙර කියවා පළකර ඇති ලේඛන වන නමුත්, දීර්ඝ ව සිදුකරන ලද අධ්‍යයනයක් ඒ තුළ නොමැත.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය මගින් තොරතුරු ලබාගැනීම, ලන්දේසි ජාතිකයින් විසින් අඳින ලද පැරණි සැලසුම් හා සිතියම් අධ්‍යයනය කිරීම, සුසානයන්හි මිනුම්ගත සැලසුම් ඇඳීම, ඡායාරූපගත කිරීම මගින් අධ්‍යයනය සිදු කරන ලදී. එසේ ම සොහොන්වල ඇති අභිලේඛන සහිත ශිලා පුවරු ස්පර්ශ ලාංඡන ලබාගෙන ඒවායෙහි මෙතෙක් නොකියවන ලද කොටස් හැකිතාක් කියවා මෙහි ඉදිරිපත් කර ඇත. එම තොරතුරු ඔස්සේ අවසන් දත්ත විශ්ලේෂණය සිදුකර නිගමනවලට එළඹ තිබේ. ඇතැම් ලේඛනවලට නිශ්චිත සිංහල අර්ථ ලබාගත නොහැකි වූ බැවින් ඉංග්‍රීසි පෙළ ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී. පිටපත් කරන ලද ලේඛනයන්හි ස්පර්ශ පිටපත් මධ්‍යම සංස්කෘතික අරමුදල ත්‍රිකුණාමලය කාර්යාලයේ තැන්පත් කර ඇත.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 ත්‍රිකුණාමලය ෆෙඩ්‍රික් කොටුවෙහි සොහොන් ස්මාරක හා ඒවායෙහි සමරු ඵලක

මෙහි ස්ථාන තුනක සොහොන් ස්මාරක 10 ක් දක්නට ලැබේ. පොකුරු වශයෙන් දෙකක් ද තනි සුසානයක් ද ඒ අතර වේ. ඒ අතරින් ලන්දේසි ජාතිකයින් විසින් පැගෝඩා හිල් වශයෙන් නම් කළ උස් බිමක සුසාන හතරක් දක්නට ලැබේ. කෝණේෂ්වරම් කෝවිලට පිවිසෙන රථ ගාල ආශ්‍රිත ව මෙම සුසාන ස්ථානගත වී ඇත. පැරණි ගෝකණ්ණ වරායට මුහුණලා (මුහුද දෙසට) මෙම සොහොන් ස්මාරක ඉදිකොට ඇති අතර ඒ දෙසින් ම ස්මාරකයන්හි බිත්තිවලට සම්බන්ධ කොට සමරු ඵලක පිහිටුවා ඇත. මෙම සුසාන හතර ම චතුරස්‍රාකාර වන අතර, මුදුනත අර්ධ වෘත්තාකාර ය. හුණුගල්, ගඩොල්, තිරිවානා ගල් හා උලු කැබලි ද අමුද්‍රව්‍ය වශයෙන් යොදාගෙන මේවා නිර්මාණය කොට ඇත. ආකෘතික වශයෙන් මෙම සුසාන හතර ම සමාන ය (සැලසුම 1). යටත් විජිත අවදිය සම්බන්ධයෙන් මෙම සුසානවල ඇති සමරු ඵලක සමකාලීන මූලාශ්‍රයයක් බැවින් පුරාවිද්‍යාත්මක ව අතිශය විශ්වාසදායක ය. තවත් පොකුරක් 'ද හොලන්ඩ්' (පෝචුගීස්) යුධ අට්ටාලය අසල (යුධ හමුදා කඳවුර තුළ) ස්ථානගත ව ඇත. එම ස්ථානයෙහි සමරු ඵලක ප්‍රමාණයෙන් අනෙක්වාට සාපේක්ෂ ව විශාල ය.

### 3.1.1 රථගාල අසල පොකුර (Cluster)

- **අංක 01 සුසානය හා සිහිවටන පුවරුව**

එකම ස්ථානයේ සුසාන හතරක් දැකිය හැකිය (ඡායාරූප 1,2,3,4). ඒවා පොළොව මට්ටමේ සිට අඩි දෙක හමාරක් පමණ උසින් යුක්ත ය. ආයත චතුරස්‍රාකාර සුසානයේ මුදුනත වක්‍රාකාර ය. මේවායෙහි පැරණි බදාම කපලාරුව ද ආරක්ෂා වී පවතී. මෙම සොහොන් ස්මාරකයේ සිහිවටන පුවරුව ඔපමට්ටම් කරන ලද ගල් පුවරුවකි. අක්ෂර උන්නත (Emboss) ව දක්වා ඇත. ඉංග්‍රීසි අක්ෂරවලින් මේවා ලියා ඇත. ජර්මානු භාෂා යෙදීම් සඳහා ඇති සංකේත (Umlauts) ඇතැම් ලිපිවල දැකිය හැකිය. අක්ෂර පේළි 09 කින් යුක්ත ය. මෙම පුවරු ලේඛනය ලන්දේසි බසින් රචිත ය. රචිත වර්ෂය ලිපිය තුළ නිශ්චිත ව දක්වා ඇත. මටසිලිටි ආකාරයෙන් සකස් කළ ගල් පුවරුවේ අක්ෂර උලුප්පා (Emboss) දක්වා ඇත. පුවරුව වටා ද සණ දාරයක් සේ පුවරුවේ මායිම (Border) උලුප්පා (Emboss) දක්වා ඇත. පුවරුවේ අක්ෂරවලට ඉහළින් මිනී හිස් කබල සමග අස්ථි යුග්මය (symbol of death) දක්වා ඇත. පුවරුවේ දිග 88 cm පමණ ද පළල 52 cm පමණ ද වේ.

පෙළ -

HERE RUST IN DEN HEERE

MEJUFF JOHANNA JACOBA

STEMONS IN LEEVEN

HUIS VAN DEN OPRECHTE

BURGYN JOHHEND HARTSZOON

UND 35 JAAR EN 2 MAAND

GEBOREN K:D 31 AUGUSTUS 1757

OVERLEDEN D: NOVEMBER 1792

සිංහල අර්ථය -

"මෙහි විවේකීව සිටින්නේ

ගෞරවණීය ජීවිතයක් ගත කළ

ජොහානා ජකෝබා ස්ටෙමනෝස් ආර්යාව යි.

ඇයගේ ස්වාමියා ජොහෙන් යන අයයි.

වයස අවුරුදු 35 ක් හා මාස දෙකක් වූ ඇය කළුරිය කළේය.

උපත 1775 අගෝස්තු 31 දින සිදුවිය.

1792 නොවැම්බර් විපත සිදුවිය."

ඒ අනුව මෙහි ඇති සටහන සැළකිල්ලට ගැනීමේ දී මෙය මෘත දේහ යුගලයක් සහිත සොහොන් ස්මාරකයක් බව පැහැදිළි ය. එසේ ම ඇය ප්‍රභූ පැළැන්තියේ කාන්තාවක් බව ද බුහුමනට පාත්‍රවිය යුතු බැවින් මෙවැනි ස්මාරකයක් ඉදිකොට ඇති බව ද පැහැදිලි ය. මෙහි K:D යනුවෙන් සඳහන් ව ඇත්තේ Kerlelijke Doop යන්න යි. අදාළ දිනයේ දී උපත හා භෞතීස්මය දේවස්ථානයේ සිදුකර තිබේ. තනිව යෙදී ඇති D: යන්නෙන් Den යන්න කියැවේ.

- **අංක 02 සුසානය හා සිහිවටන පුවරුව**

එක පෙළට ඇති සොහොන් ත්‍රිත්වයේ මැද සොහොන් ස්මාරකයේ පුවරු ලිපිය මෙය වේ. ඔපමට්ටම් කොට සකස් කළ ගල් පුවරුවේ අක්ෂර උලුප්පා (Emboss) දක්වා ඇත. පුවරුව වටා ද සණ දාරයක් සේ පුවරුවේ මායිම (Border) උලුප්පා (Emboss) දක්වා ඇත. පුවරුවේ අක්ෂරවලට ඉහළින් ලාංඡනයක් (Logo) දක්වා ඇත. පුවරුවේ දිග 87 cm පමණ ද පළල 56 cm පමණ ද වේ. ලන්දේසි බසින් රචිත ය. ප්‍රභූ පැළැන්තියේ කපිතාන්වරයෙකුගේ සොහොන් ස්මාරකයකි.

පෙළ -

HERE ON DER RUST

DEN WELED MANN HEER

ANINOEL ÄGEMAN

IN LEEVEN KAPITEIN DER

MILITIE GEBTETSTOKNOLM

DEN 31 JANU ARY A:D 1729

IN DEN HEERE ONTSLAAPEN

DEN 30 JULY A:D 1798

සිංහල අර්ථය -

"මෙහි විවේකීව සිටින්නේ

අග්‍රගණ්‍ය පුද්ගලයෙකු වූ

ඇනිනොයෙල් ලාග්මන් නම් වූ

හමුදා කපිතාන්වරයා ය.

1729 ජනවාරි මස 31

දින ඉපිද ක්‍රි. ව. 1798 ජුලි 30 වැනි දින

දෙවි සමිඳුන් තුරුලේ සැතපිණි.

- **අංක 03 සුසානය හා සිහිවටන පුවරුව**

මෙම ලිපිය ජර්මන් හා ඕලන්ද භාෂා දෙකින්ම මිශ්‍රව රචනා වී ඇති බවක් පෙනේ. මුල් පේළි හතර ජර්මානු ය. එයින් අදාළ කාලයේ භාෂා භාවිතය පිළිබඳ අදහසක් ලබා ගැනීමට මෙය කදිම නිදසුනකි. ඔපමට්ටම් කොට සකස් කළ ගල් පුවරුවේ අක්ෂර උලුප්පා (Emboss) දක්වා ඇත. පුවරුව වටා දාරයක් සේ පුවරුවේ මායිම (Border) උලුප්පා (Emboss) දක්වා ඇත. පුවරුවේ අක්ෂරවලට ඉහළින් මිනී හිස් කබල සමග අස්ථි යුග්මය (symbol of death) දක්වා ඇත. පුවරුවේ දිග 89 cm පමණ ද පළල 50 cm පමණ ද වේ.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

පෙළ -

JCHLIEGE UND SCHLAFFE

GANZMIT FRIED ENDEN

DER HEER H: I ETMIRDAS

ICH SICHER WOHNEN

MEJUF IOH: HENR PIETERS

IN LEEVEN HUISV: VAN

DEN WELED MANH: HEER

GERRTT DEN ANGE LUST

-ERZEE EN EOUIPAGIE.F

-TE TRINKONOMALEE

-EB TRINK: JOIANA: 1678

OVER DE D: 31 MAY 1898

අර්ථය -

බොරු කීම හා නිදාගැනීම

සම්පූර්ණයෙන් ම සාමයෙන් අවසන් කරන්න.

හමුදාවේ මම

ආරක්ෂිත ව ජීවත් වෙමි.

හෙන්රි පීටර්ස් විසිතුරු නිවසේ

..........................

ත්‍රිකුණාමලයේ දී

ජොයානා 1678

1898 මැයි 31 දින

- **අංක 04 සුසානය හා සිහිවටන පුවරුව**

මෙම සුසානය මුලින් සඳහන් කළ සොහොන් පොකුරේ ම තනි සොහොනක් වශයෙන් දැකිය හැකිය. මෙය ඉංග්‍රීසි භාෂාවෙන් රචිත ය. පුවරුව හාරා කෙටුම්පත් කර ඇත. පුවරුවේ මායිම (Border) ද දක්වා නැත. එබැවින් පෙර ලිපි තුනට වඩා වෙනස් ය. පුවරුවේ දිග 94 cm පමණ ද පළල 64 cm පමණ ද වේ. මෙම සොහොන් ස්මාරකය වෙනත් ස්ථානවලින් ගෙනෙන ලද අමුද්‍රව්‍ය කොටස්වලින් සකස් කළ බවට පැහැදිළි සාධක පවතී. ද්විඪ ශිලා ලේඛනයකට අයත් 42 cm×22 cm ප්‍රමාණයේ කොටසක් බිත්තියට තබා බැඳ තිබීම එය සනාථ කරන එක් සාධකයකි.

පෙළ -

HERE LIES THE BODY

OF

JAMES LA HEY

PAY MASTER OF HM. 19 REG: FOT

WHO DEPARTED THIS LIFE

THE 25 MRCH 1802

AGED 37

HE LIVED UNIVERSALLY ESTEMED

AND DIED UNIVERSALLY REGRETTED

BY THE CORPS:

අර්ථය -

මෙහි සැතපී සිටින්නේ

'ජේම්ස් ලා හේ'

වැටුප් නිලධාරීතුමාගේ සිරුර යි.

19 වැනි රෙජිමේන්තුවේ සේවය කළ

ක්‍රි. ව. 1802 මාර්තු මස 25 වැනි දින

වර්ෂ 37 ක් ආයු වළඳා අභාවප්‍රාප්ත විය.

ඔහු විශ්වීය වශයෙන් ගෞරවයට පාත්‍ර වූ අයෙකි.

විශ්ව නීතිය අනුව ශෝකයට පත්

බළකායේ පිරිස විසිනි.

මෙහි HM යනුවෙන් කෙටිකර ඇත්තේ His/Her Majestie's යන්න ය. REG:FOT යනු පාබල සේනාංකය යන්න යි.

### 3.1.2 යුධ හමුදා කඳවුර තුළ පොකුර (Cluster)

221 බළසේනා මූලස්ථානය (221 Brigade headquarters) තුළ මෙම සුසාන පොකුර ස්ථානගත වී ඇත. මෙහි සොහොන් ස්මාරක පහකි. මුහුදට මීටර් 30 පමණ ආසන්නයේ The cat යුධ අට්ටාලය අසල පිහිටි පොළොවට වඩා තරමක් උස් වේදිකාවක මෙම ශිලාපුවරු සහිත සුසාන ස්ථාපනය කර ඇත. මේ වේදිකාවේ සමාන්තර උසින් සුසාන හතරක් ස්ථාපිත ය. මධ්‍යයේ ශිලාමය කුරුසයක් ඇති අතර, එහි 1842


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

යනුවෙන් නෙලා ඇත. එහි දෙපස සොහොන් යුගල දෙකකි (සොහොන් 04). මෙම ලිපි හතරේ ම ඔපමට්ටම් කොට සකස් කළ ගල් පුවරුවල අක්ෂර උලුප්පා (Emboss) දක්වා ඇත (ඡායාරූප අංක 5,6,7,8,9). මෙම සියලු සුසාන නිරිත දිශානුගත ව පිහිටුවා තිබේ. මෙම සුසාන හතර ම යට දක්වන ලද සුසාන මෙන් වේදිකාවට සමාන්තර ව ඇති අතර එයින් උඩට නිර්මාණය කර නැත.

- **අංක 05 සුසානය හා සිහිවටන පුවරුව**

ඉහතින් දක්වන ලද සුසාන අතුරින් පළමුවැනි සුසාන ස්මාරකය සුසානය ඉදිරිපිටට මුහුණලා සිටගත් විට දකුණු පසින් ඇති පළමු සුසානය වේ. මෙය 230 cm දිගින් හා 115 cm පළලින් යුතු අලංකාර ගල් පුවරුවකි. එය වටා දාරයක් සේ පුවරුවේ මායිම (Border) මෝස්තර සැරසිල්ලක් සහිත ව උලුප්පා (Emboss) දක්වා ඇත. පුවරුවේ අක්ෂරවලට ඉහළින් ලාංඡනයක් (Coat of arms) තිබේ. එහි ඉහළ කොටසේ කිරීටයකින් හා අභ්‍යන්තරයේ කුකුළෙකුගේ රූපයක් ද දැකගත හැකිය. මෙය නෞකාවට හෝ අදාළ නිලධාරියාගේ රෙජිමේන්තු සංකේතය විය හැකිය. අක්ෂරයක ප්‍රමාණය 5×4 cm පමණ වේ.

පෙළ -

HIER ON DER LEGDBEGR

MONSIEUR MARTH

LENGEL, INZYNL...

BOEKHOUDERIN'S EC

DIENST, ENSECUNDE...

FORTRESSE, GEEOREN

IAFFANAPATNAM, DEN...

AUGUST USA ON 1691, EN OVER₌

LEDENDEN 26˜, JUNY, A ON 1722 (Penry lewis 1913)

Transcript:

Hier onder legd begraven Monsieur Mabth. Lengelb in zyn (leven) boekhouder in's E. C. dienst en Secunde (van dit) Fortresse, geboren tot Jaffanapatnam den 16 Augustus 1691 en overleden den 26 Juny, Ao. 1722.

අර්ථය -

ගෞරවණීය

Monsieur Mabth මෙහි තැන්පත් කර ඇත.

ගිණුම් සේවයේ යෙදුණු එතුමා

1691 අගෝස්තු 16 වැනි දින යාපනපටුනේ උපත ලබා

1722 ජූනි 26 දින මියගියේය.

- **අංක 06 සුසානය හා සිහිවටන පුවරුව**

මෙම පුවරුව වටා දාරයක් සේ පුවරුවේ මායිම (Border) මෝස්තර සැරසිල්ලක් සහිත ව උලුප්පා (Emboss) දක්වා ඇත. එම සැරසිල්ල සිව්කොණ මිනිස් මුහුණු හතරකි. දිග කොටසෙහි මධ්‍යයෙහි ද මුහුණ බැගින් මතුකර දක්වා ඇත. ඒ අනුව සමස්ත මුහුණු ප්‍රමාණය හයකි. එම පුවරුවේ අක්ෂරවලට ඉහළින් ලාංඡනයක් (Coat of arms) තිබෙන්නට ඇතැයි හිස් අවකාශය පිළිබඳ සැළකිලිමත් වීමේදී උපකල්පනය කළ හැකිය. පුවරුවේ දිග 190 cm පමණ ද පළල 95 cm පමණ ද වේ. අක්ෂරයක ප්‍රමාණය 5×4 cm පමණ වේ.

පෙළ -

˜Hereues˜

Captatn Thomas Griffin

Commander of His Majestÿs

Shtpthe Prthcefs Mary

Who Dtcdthe 11th: Sept:1745

Anno Aetatissuae

48



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

අර්ථය -

මෙය

උතුමාණන්ගේ නෞකා බළසණයේ

මේරි කුමරිය යාත්‍රාවේ අණදෙන නිලධාරී

තෝමස් ගීෆන් ගේ ය.

ක්‍රි. ව. 1745 සැප්තැම්බර් 11 වැනි දින

- **අංක 07 සුසානය හා සිහිවටන පුවරුව**

ඔපමට්ටම් කොට සකස් කළ ගල් පුවරුවකි. පුවරුව වටා දාරයක් සේ පුවරුවේ මායිම (Border) උලුප්පා (Emboss) දක්වා ඇත. පුවරුවේ අක්ෂර මේ වන විට බෙහෙවින් මැකී ඇති අතර, ඊට පහළින් මිනී හිස් කබල සමග අස්ථි යුග්මය (symbol of death) දක්වා ඇත. පුවරුවේ දිග 230 cm පමණ ද පළල 127 cm පමණ ද වේ.

- **අංක 08 සුසානය හා සිහිවටන පුවරුව**

දිග 101 cm පමණ ද පළල 130 cm පමණ ද වන මෙම පුවරුව වටා දාරයක් සේ පුවරුවේ මායිම (Border) උලුප්පා (Emboss) දක්වා ඇත. එම පුවරුවේ අක්ෂරවලට පහළින් ලාංඡනයක් (Coat of arms) දැකිය හැකිය. එහි මධ්‍යයේ පුන්කලසක් වැනි සංකේතයක් දැකිය හැකිය. අක්ෂරයක ප්‍රමාණය 5×4 cm පමණ වේ.

පෙළ -

HIERONDER LEGDBEGRAAVEN

REBECCASCHODT

INHAAR LEEVENHUYSVROUWVAN

DENOPPERCOOPMANENOPPERHOOFD

DERCYLONSEOOSTERSEDISTRIOTEN

MARTENREIN.GEBOORENTOTCOLOM

BODEN22.DECEMBER ANNO 1600.EN

OVERLEEDENDEN6.IUNYANNO 1760

OUD 60 IAREN.5MAANDENENJ5DAGẼ

අර්ථය

මෙහි සැතපෙන

රෙබෙකා ස්කොඩ්ට්

නැගෙනහිර දිස්ත්‍රික්කවල ප්‍රධානියා වූ

1690 දෙසැම්බර් 22 වැනි දින කොළඹ දී උපත ලද

මාටින් රෙයින්ගේ ආර්යාවයි.

1760 ජනවාරි 06 දින

උවුරුදු 69 කුත් මාස පහක් හා දින පහළොවක් ඇවෑමෙන්

මියගියේය.

මෙහි සිටින රෙබෙකා ස්කොඩ්ට් බොහෝවිට කොළඹ සාරා ද මීස්ට්‍රගේ දියණිය විය හැකිය.

- **අංක 09 සුසානය හා සිහිවටන පුවරුව**

ඉහතින් දක්වන ලද වේදිකාවට තරමක් පහතින් තනි සුසානයක් වශයෙන් මෙම ශිලා පුවරුව සහිත සුසානය දැකිය හැකිය. මෙම ස්ථානයේ අනෙකුත් ලිපි උලුප්පා (Emboss) දක්වා ඇති අතර මෙම ගල් පුවරුව තරමක් ගැඹුරට හාරා අක්ෂර නෙලා ඇති බැවින් විශේෂිත ය. පුවරුවේ දිග 118 cm පමණ ද පළල 79 cm පමණ ද වේ. සැරසිලි රටා කිසිවක් මෙහි දක්නට නැත.

පෙළ -

TO THE MEMORY

OF

CHARLES HAY

LIEUT.ROYAL ENGINEERS

who died in TRINCOMALEE

on the 27th AUGUST ad 1823

of fever which attacked him

when employed in the arduous

duty of tracing through the

country living 30 or 40 miles

distant from TRINCOMALEE

the line of high rood from

thence to COLOMBO


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

අර්ථය

චාල්ස් හේ ස්මරණය යි.

රාජකීය ඉංජිනේරු ක්‍රි. ව. 1823 අගෝස්තු 27 දින

ත්‍රිකුණාමලයේ දී මිය ගියෙන්

ත්‍රිකුණාමලයේ සිට කොළඹ දක්වා තැනෙන මහා මාර්ගයට

සැතපුම් 30 ක් 40 ක් දුරින්

නිරීක්ෂණ දුෂ්කර රාජකාරියේ යෙදී සිටියදී

වැළඳුණු උන රෝගයෙන් මියගිය වගයි.

19 වැනි රෙජිමේන්තුවේ ලුතිනන්වරයෙකු වූ චාල්ස් හේ 1810 ජනවාරි 16 දින තෙවැනි ලංකා රෙජිමේන්තුවේ ලුතිනන් ලෙස ද, 1817 අප්‍රේල් 25 වැනි දින එම රෙජිමේන්තුව ද ගැසට් කරන ලද්දේ ද විය. පිලිප් හේ 1807 ද එවැනි රෙජිමේන්තුවේ කපිතාන් බවට පත් වූ අතර, අලෙක්සැන්ඩර් මරේ හේ 1814 නොවැම්බර් මස 10 දින 1 වැනි ලංකා රෙජිමේන්තුවේ දෙවැනි ලුතිනන් බවට පත්විය.

### 3.1.3 මැතිවරණ කාර්යාලය අසල සුසානය

- **අංක 10 සුසානය හා සිහිවටන පුවරුව**

කොටුව පරිශ්‍රයේ සාධක වැඩිම ප්‍රමාණයක් ආරක්ෂා වී ඇති සුසානය මෙය වේ (ඡායාරූප අංක 10). මෙය පුරාවස්තු විනාශකරන්නන් විසින් තරමක් හාරා විනාශ කොට ඇති නමුත් එය තහවුරු කිරීමක් මගින් යළි ප්‍රකෘතිමත් කළ හැකි වනු ඇත. දිග 78 cm පමණ ද පළල 60 cm පමණ ද වන මෙම පුවරුව වටා දාරයක් සේ පුවරුවේ මායිම (Border) උලුප්පා (Emboss) දක්වා ඇත. එම පුවරුවේ අක්ෂරවලට ඉහළින් ලාංඡනයක් (Coat of arms) දැකිය හැකිය. එම ලාංඡනය මධ්‍යයේ ඉංග්‍රීසි අක්ෂර මෙන් ම විවිධ රූප වැනි සංකේත ද දැකිය හැකිය. මෙය කිසියම් පිරිසක් විසින් හාරා ඇති බැවින්, මෙම පුවරුවේ ඝණකම ලබාගත හැකිය. මෙහි ඝණකම 18 cm වේ.

පෙළ -

HIERLEGT

DENONWARDEERBAREFECHTGE

NOOTDEGOLDHARTIGEVADER

DENWELEDELGEBOORENHEER

JACQUESFABRICE VAN SENDEN

IN LEEXCTL KOOPM……………

HOOFTYN JR……………………….

…………………………………………….

……………………………………..1755

…….den oude………………34

HOEKORT IS HET LEPVEN

HOELANGIS DE EEUWIGHETI

අර්ථය

මෙහි

කාරුණික පියෙකු වූ හා ස්වාමි පුරුෂයෙකු වූ

ජැක් ෆැබ්රිස් වැන් සෙන්ඩන්

ජීවත් ව සිටි ත්‍රිකුණාමලයේ ප්‍රධානියා වූ ද

.......................

උපත 1755 වසරේ උට්‍රෙච් හි


34 වැනි වියේ දී

1789 ඔක්තෝබර් මිය ගියේය.


(Journal, R.A.S., C.B., vol.XVIII, p.66.)

ජේක්ස් ෆැබ්‍රිස් වැන් සෙන්ඩන් 1778 අප්‍රේල් 05 දින කොළඹ දී විවාහ වූ අතර, ගෙරිට් ඇන්ගල් හොල්ස්ට් සහ මේරියා ෆ්‍රැන්සිනා ස්කෝක්මන්ගේ දියණිය වන සාරා මේරිස්, ෆ්‍රැන්සිනා හොල්ස්ට් සමඟ විවාහ විය.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk




**සිතියම 1 (සොහොන් ස්මාරක ස්ථානගත වීම - ෆෙඩ්‍රික්**




**සිතියම 2 අංක 3 දරන සොහොනේ ඉදිරිපස හා පැති පෙනුම**


*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk*

වගුව 1: සොහොන් කිහිපයකට ආදාළ පුද්ගල නාම හා වෙනත් විස්තර

| අනු අංකය | මියගිය පුද්ගල නාමය | ස්ත්‍රී/පුරුෂ භාවය | වයස | තත්ත්වය | උපත | විපත |
|---|---|---|---|---|---|---|
| 1. | MEJUFF JOHANNA JACOBA STEMONS | ස්ත්‍රී | 35 | | 1775/8/31 | 1792/11 |
| 2. | ANINOEL ÄGEMAN | පුරුෂ | 75 | කපිතාන් | 1723/1/31 | 1798/7/30 |
| 3. | JAMES LA HEY | පුරුෂ | 37 | වැටුප් නිලධාරී | | 1802/3/25 |
| 4. | THOMAS GEIFEIN | පුරුෂ | | කපිතාන් | | 1745/9/11 |
| 5. | REBECCA SCHODT | ස්ත්‍රී | | | | |
| 6. | CHARLES HAY | පුරුෂ | | ඉංජිනේරු | | 1823/8/27 |

විමර්ශිත සොහොන් ස්මාරකවල ඇති ලිපි සමකාලීන මූලාශ්‍රයයක් වශයෙන් විශ්වසනීය සාධකයක් වශයෙන් සැලකිය හැකිය. මෙම සටහන් පුවරු හුදෙකලා සටහන් පුවරු නොවේ. මෙයට සමාන තවත් සුසාන භූමි ලෝකයේ විශාල ප්‍රමාණයක් දැකිය හැකිය. ශ්‍රී ලංකාවේ වුව ද මෙම කාලයට හා ආකෘතියට සමාන සුසාන ස්මාරක හා සුසාන භූමි දිස්ත්‍රික්ක ගණනාවකින් වාර්තා වී ඇත. ත්‍රිකුණාමලය නගරසභා ගොඩනැගිල්ල ඉදිරිපිට සුසානභූමියේ ද මේ සමකාලීන සුසාන දැකිය හැකිය. එබැවින් අනෙකුත් සුසාන හා සසැඳීමේ දී මේවායේ සමානත්වයක් පවතින බව පැහැදිළි ය. මෙම සුසාන අතුරින් ඇතැම් ඒවායේ තැන්පත් කළ සිරුරු හිමි පුද්ගලයින් ප්‍රභූන් ය. ඇතැමුන් යුධ කටයුතුවලදී මියගිය අය වෙති. පවුලේ සමීපතමයින් ද ඔවුන් සමග මිය ගිය අවස්ථා මෙහි හමුවේ. ඔවුන්ගේ පුද්ගල නාම හා වෙනත් ජීවන තොරතුරු පිළිබඳ සැලකිලිමත් වීමේ දී ඒවායින් කිපිහපයක් වගුව 1 පරිදි පෙළගැස්විය හැකිය. ඒ අනුව කාන්තා හා පුරුෂ යන දෙපාර්ශ්වයට ම අයත් සුසාන මෙහි ඇති බව පැහැදිළි වේ. ඔවුන්ගේ තරාතිරම හා වයස යනාදිය ද එමගින් අනාවරණය කරගත හැකිය.

## 4. සමාලෝචනය

මෙම පර්යේෂණය මගින් 18 හා 19 වැනි සියවස්වලට අයත් සොහොන් දහයක් අධ්‍යයනයට පාත්‍ර වූ අතර, ඒවා කිසිවක් කැණීමට භාජනය නොවීය. නමුත් එම සෑම සුසානයක ම විස්තර පුවරුවක් ස්ථාපිත බැවින් මියගිය පුද්ගලයින්ගේ නම්, ජාතීන්, අයත් රටවල්, මියගියවුන්ගේ තරාතිරම් හා වයස ආදිය හඳුනාගත හැකිව තිබේ. මෙම සියලු සොහොන් විදෙස් ජාතිකයින්ගේ වන අතර, සියලු දෙනා 1505 ත් 1948 ත් අතර සිදුවූ යුරෝපීය බල ව්‍යාප්තියට බන්ධවූවන් වේ. ඔවුහු පරිපාලන කටයුතු හා යුද්ධය සඳහා පැමිණි අය වෙති. අඩු වයසින් මිය යෑමට හේතුව සටන්වල දී වෙඩි වැදීම යි. ඇතැම්හු රෝග හෝ වෙනත් හදිසි තත්ත්වයන් මත මිය යන්නට ද ඇත. මේ අතරින් ඇතැම්හු මියගොස් වසර එකසිය පණහත් දෙසීයත් අතර වේ. එනම් පරම්පරා දෙකක් හෝ තුනකට පෙර මියගිය අය බැවින් ඔවුන්ගේ ඥාති මුණුබුරන් හා මිනිබිරියන් එම සුසාන දැකබලා ගැනීමට පැමිණෙන අවස්ථා තිබේ. ඔවුන්ගේ පරම්පරාවලට අයත් ව ලිඛිත සටහන්වල එම මුතුන් මිත්තන් ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලයේ දී මියගිය බවත්, ඔවුන්ගේ සොහොන් බලකොටුව තුළ ඇති බවත් විටින් විට ලංකාවට පැමිණ මෙම ස්ථානය නැරඹීමට පැමිණි ඔවුන්ගේ ඥාතීන්ගෙන් දැනගත හැකි විය. එම ඥාතීන්ගේ නම් රැගෙන විත් සුසාන පරීක්ෂා කර තම ඥාතිවරයාගේ සුසානය හඳුනා ගන්නා අවස්ථා සංවේදී ය. එක් විදේශීය පවුලක් විසින් සිය මිත්තණියගේ සිරුරේ අලු මෙරටට රැගෙන විත් සිය ඥාතිවරයාගේ සොහොන අසල මිහිදන් කළ අවස්ථාවක් ද අපගේ නිරීක්ෂණයට ලක්විය. ඒ අනුව පුරාවිද්‍යාත්මක වශයෙන් මෙන් ම සංස්කෘතික වශයෙන් ද සජීවී බවක් එක්කරන ස්මාරක කිහිපයක් වශයෙන් අපගේ අධ්‍යයනට පාත්‍ර වූ මෙම

සුසාන හැඳින්විය හැකිය. මේවා ඉදිකිරීමට වෙනත් ස්මාරකවල කොටස් භාවිත කර ඇති බවට මෙහි යට දක්වා ඇති තෙවැනි ලිපිය සහිත සොහොනේ ද්‍රවිඩ ශිලා ලේඛන කොටස දැක්විය හැකිය. එය මෙම භූමියේ වෙනත් ස්ථානයකින් රැගෙන එන ලද්දකි. ත්‍රිකුණාමලය කොටු බැම්ම ඉදිකිරීමේ දී මෙම සන්සිද්ධිය හොඳින් නිරීක්ෂණය කළ හැකිය. කැටයම් සහිත ගල් පුවරු කොටස් රැසක් කොටුබැම්මට තබා ඇති අතර, ද්‍රවිඩ ශිලා ලේඛන කිහිපයක් ද පඩිපෙළ් ආශ්‍රිත ව හඳුනාගත හැකි විය. ඒ අනුව ත්‍රිකුණාමලයේ පැරණි ස්මාරකවලට සැලකිය යුතු හානියක් මෙම අවදියේ සිදුව ඇති බව නොරහසකි.

## 5. උපකාරානුස්මෘතිය

මෙම පර්යේෂණයට දායකත්වය සැපයූ පුරාවිද්‍යා විශේෂ උපාධිධාරිණීන් වන එච්. එම්. සී. කේ. හේරත්, බී. එම්. ආර්. සොයිසා, බී. එල්. චතුරිකා හා සංස්කෘති සංචරණය විශේෂවේදී උපාධිධාරී ඩී. එච්. ඩී. හේවගේ, ටී.ඩී.සී. පුෂ්පකුමාර යන අයට විශේෂ ස්තුතිය හිමිවේ.



ඡායාරූපය 1: අංක 1 සොහොනේ ඵලකය



ඡායාරූපය 2: අංක 2 සොහොනේ ඵලකය

## ආශ්‍රිත මූලාශ්‍රය


- සිරිසේන, පී.එල්. 2009, **සිරි ගෝණමලය හෙවත් ත්‍රිකුණාමලය**, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ 10.
- Lewis, J.P. 1993, List of inscriptions on tombstones and monuments in Ceylon of historical or localinterest, with an obituary of persons uncommemorated, Navrang in collaboration with lake house bookshop, Colombo.
- Penry lewis J., H.C cottle, 1913, **LIST OF INSCRIPTIONS ON TOMBSTONES AND MONUMENTS IN SEYLON**, government printer, Colombo, Ceylon.
- Siriwardana, T.M., 2013, Material Culture of Death, Grief and Memory: A Case Study, Asian Art, Culture and Heritage, International Association for Asian Heritage,Centre for Asian Studies, University of Kelaniya, Sri Lanka.



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk



ඡායාරූපය 3: අංක 3 සොහොනේ ඵලකය




ඡායාරූපය 4: අංක 4 සොහොනේ ඵලකය



ඡායාරූපය 5: අංක 5 සොහොනේ ඵලකය



ඡායාරූපය 6: අංක 6 සොහොනේ ඵලකය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk



ඡායාරූපය 7: අංක 7 සොහොනේ එලකය




ඡායාරූපය 9: අංක 9 සොහොනේ එලකය




ඡායාරූපය 8: අංක 8 සොහොනේ එලකය




ඡායාරූපය 10: අංක 10 සොහොනේ එලකය